# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2016.03.01

වේලාව : ප.ව. 02.30

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය, බස්නාහිර පළාත.

**සහභාගී වූ නිළධාරීන්ගේ නාම ලේඛනය :**

1) ජේ.එම්.සී.ජයන්ති විජේතුංග මිය - ප්‍රධාන ලේකම් ( බ.ප).
2) පී. සෝමසිරි මයා. - ආණ්ඩුකාර ලේකම් (බ/ප).
3) වී. රාජපක්ෂ මිය - ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).
4) එච්.ඩී.කේ. සමරකෝන් මයා - සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප).
5) එම්.ඒ.බී.ඩී.සෙනරත් මයා - ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප).
6) එස්.ජී. විජයබන්දු මයා - ලේකම්, අධ්‍යාපන, සංස්කෘතික අමාත්‍යාංශය (බ.ප).
7) ටී.වී.ඩී.ඩී.එස්.කරුණාරත්න මෙය- ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප).
8) ප්‍රදීප් රත්නායක මයා - ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය(බ/ප).
9) කේ.කේ. චම්පිකා කනේරු මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).
10) සිරිසෝම ලොකුවිතාන මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු).
11) බන්දුල ප්‍රේමකුමාර මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය).
12) ඩබ්.එම්.ඩී.එන්.රණසිංහ මයා - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු).
13) සේනක සිල්වා මයා - අධ්‍යක්ෂ(සැලසුම්).
14) කේ.එන්. සූරියආරච්චි මිය. - සහකාර ප්‍රධාන ලේකම් (පාලන).
15) එස්.ඒ.එස්.ඩී. ජයසූරිය මිය - සහකාර ප්‍රධාන ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.

**ලේකම්වරුන් විසින් පහත කරුණු පිළිබඳව සාකච්ඡා කළ අතර, පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | බස්නාහිර පළාත් සභා කාර්යාල එකම භූමියක ස්ථාපිත කිරීම. | නව පරිශ්‍රයේ ගැටළු හා අභ්‍යන්තර සකස් කිරීම් පිළිබඳ සොයා බැලීම සඳහා සහා ලේකම් හේමන්ත සමරකෝන් මහතාගේ සභාපතිත්වයෙන් හා දයා සෙනරත්, එස්.පී.විජයබන්දු, ප්‍රදීප් රත්නායක යන ලේකම් වරුන්ගේ සහ නි.ප්‍ර.ලේ.(ඉංජිනේරු) නිමල් රණසිංහ යන මහත්වරුන්ගෙන් සමන්විත කමිටුවක් ස්ථාපිත කිරීම.<br>වාහන නැවැත්වීම සඳහා බස් නැවතුම් පොළ භූමිය ලබා ගැනීම හා ඒ සඳහා වෙනත් ඉඩමක් ලබා දීම සඳහා අවධානය යොමු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 02. | තාක්ෂණ සේවයේ නිලධාරීන් බඳවා ගැනීම | දැනට අනුමත තාක්ෂණ සහකාර තනතුරු 685න් පුරප්පාඩු 197ක් ඇති බවත්, පුවත්පත් දැන්වීම් සඳහා ලේක් හවුස් ආයතනය වෙත යොමු කර ඇති බවත් ප්‍රධාන ලේකම්තුමිය වෙත දැන්විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව. |
| 03. | තොරතුරු තාක්ෂණ සේවයේ සහකාර අධ්‍යක්ෂ තනතුර. | තොරතුරු තාක්ෂණ සංවර්ධන ආයතනයේ පවතින ‘සහකාර අධ්‍යක්ෂ’ තනතුරු 3න් එක් තනතුරක් ප්‍රධාන ලේකම් කාර්යාල-තොරතුරු තාක්ෂණ අංශයට ආදේශ වන පරිදි ගැළපීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 04. | ජනාධිපති තුමාගේ දේශීය ආහාර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම. | මාර්තු 6,7 හා 8 දිනවල BMICH හි සංවිධානය කර ඇති කෘෂිකාර්මික ප්‍රදර්ශනය සඳහා “නාගරික කෘෂිකර්මය” යන තේමාව යටතේ වෙළඳ කුටියක් සංවිධානය කර ඇති බව ස.ප්‍ර.ලේ.(කෘෂි.අමා.) විසින් දන්වන ලදී.<br>කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් දියත් කරනු ලබන සැලසුම් පිළිබඳ ප්‍ර/ලේ සැලසුම් අංශය දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය.<br><br>අධ්‍යක්ෂ (සැලසුම්). |

| | | | |
|---|---|---|---|
| 05. | නව වාහන මිලදී ගැනීම. | මුල්‍ය ප්‍රතිපාදන සීමා සහිත බැවින්, නිලධාරීන් සඳහා අත්‍යාවශ්‍ය වාහන පමණක් මිලදී ගැනීම සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ කුලී පදනමට ඉල්ලා ඇති වාහනයේ අනුමැතිය ලබා ගැනීම.<br>සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යවරයා භාර නො දුන් වාහනය වහාම ලබා ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br>ආණ්ඩුකාර ලේකම්<br>සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් |
| 06. | නිල නිවාස පිළිබඳ කාර්ය සාධන බලකාය | ආණ්ඩුකාර තුමාගේ නිල නිවස සඳහා යෝජිත මලලසේකර මාවතේ ඉඩමෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ ව ප්‍රාදේශීය ලේකම්ගෙන් විමසීම<br>නිල නිවාස සඳහා තිඹිරිගස්යායේ පවතින ඉඩම නිරවුල් කර ගැනීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන).<br>ලේකම්,කෘෂිකර්ම අමාත්‍යාංශය<br>ආණ්ඩුකාර ලේකම්(බ.ප.). |
| 07. | ඉදිකිරීම් සම්බන්ධ කටයුතු. | ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධව පාසල් සංවර්ධන සමිති ක්‍රියාකාරීත්වය වරින් වර නියාමනය කළ යුතු වීම. තරගකාරී ප්‍රසම්පාදන ක්‍රම කෙරෙහි යොමු වීමට අමාත්‍යාංශ ලේකම්වරුන් එකඟ විය.<br>ප්‍රසම්පාදන සැලැස්ම යටතේ ඉදිකිරීම් සැලැස්ම කඩිනමින් සැකසීම. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු). |
| 08. | බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් කැඳවනු ලබන වාර්තා ප්‍රමාද වීම සම්බන්ධව යොමු කර ඇති ලිපිය. | පිළිතුරු ලැබී නොමැති ලිපි වල සම්පිණ්ඩන වාර්තාවක් නි.ප්‍ර.ලේ.(පාලන) විසින් ඉදිරිපත් කළ අතර, අමාත්‍යාංශ මට්ටමින් එම වාර්තා කඩිනමින් ප්‍රධාන ලේකම් වෙත යොමු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම් වරුන්. |
| 09. | ප්‍රගති සමාලෝචනය. | ශුන්‍ය පාදක අයවැය ක්‍රමය යටතේ ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම තවමත් අවසන් කර නොමැති අමාත්‍යාංශ 2016.03.04 වන සිකුරාදා අවසන් දිනය ලෙස සලකා කටයුතු කළ යුතු ය.<br>ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම හා ප්‍රගති පාලනය සඳහා කමිටුවක් පත් කර, අමාත්‍යාංශ ලේකම්වරු විසින් නිරතුරුව ප්‍රගතිය විමසා බැලීම.<br>ව්‍යාපෘති හා සැලසුම් සම්බන්ධව අමාත්‍යවරුන් දැනුවත් කිරීමට කටයුතු කිරීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්) |
| 10. | සභා රැස්වීම පවත්වන අවස්ථාවේ දී ගරු මන්ත්‍රීවරුන් විසින් රාජ්‍ය නිලධාරීන් අපහසුතාවට ලක් කරමින් ප්‍රකාශ | ගරු මන්ත්‍රීවරුන් විසින් සිදු කරනු ලබන සත්‍යවාදී විවේචන පිළිගන්නා නමුත්, සදාචාර නොවන, පදනම් විරහිත විවේචන සම්බන්ධව අප්‍රසාදය පල කරන අතර, ඒ පිළිබඳ ව සභාපති තුමා දැනුවත් කිරීම. | ආණ්ඩුකාර ලේකම්.<br>සභා ලේකම්. |

| | | | |
|---|---|---|---|
| | නිකුත් කිරීම. | | |
| 11. | වාහන තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම | තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීමට කටයුතු කරන බවත්, මේ සඳහා සමුපකාර කොමිෂන් සභාව, පරිවාස හා ළමාරක්ෂක දෙපා., සමාජ සේවා දෙපා., සංචාරක මණ්ඩලය, අධ්‍යාපන දෙපා., තොරතුරු තාක්ෂණ අධිකාරිය, කෘෂි සේවා අධිකාරිය හා පළාත් ඉඩම් දෙපා. යන ආයතන වලින් තවමත් තොරතුරු නො ලත් බවත්, නි.ප්‍ර.ලේ.(පාලන) විසින් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්. |
| 12. | තොරතුරු දන ගැනීමේ පණත ක්‍රියාත්මක කිරීම | තොරතුරු ලබාගැනීම සඳහා වෙබ් අඩවි වහාම යාවත්කාලීන කිරීම කළ යුතු ය.<br>තම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල වෙබ් අඩවි අභිමත ආකාරයකට සකස් කර යාවත්කාලීන කිරීමේ බලය ලේකම්වරුන්ට දෙනු ලැබේ. ඉන් අනතුරුව, එම වෙබ් අඩවි ප්‍රධාන ලේකම් කාර්යාලීය වෙබ් අඩවි සමඟ සම්බන්ධ කරනු ලැබේ. තොරතුරු ලබා දීමේ දී පැරණි තොරතුරු අවශ්‍ය විය හැකි බැවින් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.<br>මෙහි දී මහජනතාවගෙන් ලැබෙන පෙත්සම් සඳහා පිළිතුරු ලබා දීම වෙනුවෙන් වෙනම කණ්ඩායමක් පත් කිරීම පිළිබඳ ව සලකා බැලීම. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 13. | E-recording (SLT Server/Cloud Server) සහ බස්නාහිර පළාත් වෙබ් පිටුව | දත්ත ගබඩා කිරීම සම්බන්ධව වඩා සුදුසු SLT Server හෝ Cloud Server දැයි සොයා බලා ICTA ආයතනයෙන් උපදේශනය ලබාගෙන වාර්තාවක් ඉදිරිපත් කිරීම.<br>මෙම කාර්යයේ දී අවසානයේ ලබා දිය හැකි ඉලෙක්ට්‍රොනික ලේඛන වල (output) නීතිමය තත්ත්වය පිළිබඳ ව සොයා බලන ලෙස ද ප්‍රධාන ලේකම්තුමිය විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>තවද, ඉදිරි පරම්පරාව තොරතුරු දන ගැනීම සඳහා නවීන තාක්ෂණය වෙත පිවිසීම සිදු කරන බැවින්, ගුණාත්මක සේවයක ඇති අවශ්‍යතාව ය අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |
| 14. | නිලධාරි දත්ත පද්ධතිය සකස් කිරීම | මැතිවරණ කටයුතු සඳහා නිලධාරීන් යෙදවීමට තොරතුරු අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමට බලාපොරොත්තු වන බව, නි.ප්‍ර,ලේ.(පාලන) විසින් පෙන්වා දෙන ලදී.<br>බඳවා ගැනීම්, විශ්‍රාම ගැන්වීම් සිදු කරන සියලු ආයතන ප්‍රධානීන් වහාම නිලධාරි දත්ත | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව<br><br>සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් |

| | | | |
|---|---|---|---|
| | | පද්ධතියක් සකස් කළ යුතු වීම. | (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)<br><br>දෙපාර්තමේන්තු ප්‍රධානීන් |
| 15. | ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡාව | පළාත් සභාවේ සියලු ම ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සාකච්ඡාවක් සෑම මාස 3කට ම වරක් පැවැත්වීම පිළිබඳ ව සාකච්ඡා විය.<br>අමාත්‍යාංශ යටතේ සාකච්ඡා කළ යුතු කරුණු වේ නම්, සති 2ක් තුල දැනුම් දෙන ලෙස උපදෙස් දෙන ලදී. | සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන් |
| 16. | පාසැල් ගොඩනැගිලි සඳහා ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු යොදා ගැනීම | පාසල් අලුත්වැඩියාව සඳහා ඕස්ට්‍රේලියානු රජයේ DFAT අරමුදල මඟින් ප්‍රදානය කළ මුදල් ඇස්බැස්ටෝස් භාවිතය සඳහා යොදා නොගෙන වෙනත් අත්‍යාවශ්‍ය අලුත්වැඩියාවක් සඳහා යොදා ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 17. | කොළඹ නගරය යාචකයින්, ගවයින් හා සුනඛයන්ගෙන් තොර නගරයක් බවට පත් කිරීමේ වැඩසටහන යටතේ ළමා රැඳවුම් මධ්‍යස්ථාන ලෙස බස්නාහිර පළාතේ භාවිතයට නො ගන්නා පාසල් ලබා ගැනීම | පරිවාස දෙපාර්තමේන්තුවට අයත් නේවාසිකාගාර වල වෙනත් දරුවන් රඳවා තැබීම ගැටලුවක් බැවින් හා යාචකයන් සම්බන්ධ කටයුතු පළාත් සභාවට අයත් නොවන බැවින්, ඒ පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 18. | පුරප්පාඩු සඳහා ගුරුවරුන් බඳවා ගැනීම | 2016.03.31 දිනට විශ්‍රාම ලබන ගුරුවරුන් ද ඇතුළත් ව බස්නාහිර පළාතේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කර, පළමු අදියර ලෙස එම ගුරුවරුන් ප්‍රමාණය බඳවා ගැනීමට කටයුතු කිරීම.<br>තවද, විද්‍යාපීඨ ගුරුවරුන් බස්නාහිර පළාත ට බඳවා ගැනීම කෙරෙහි ද, වැඩිදුරටත් සාකච්ඡා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |

| | | | |
|---|---|---|---|
| 19. | වෙනත් | මීගමුව රෝහලේ නේවාසිකාගාරයෙන් වෛද්‍යවරුන් ඉවත් ව නොයැමේ ගැටලුව පිළිබඳ වාර්තාවක් ලබා දීම සඳහා කටයුතු කිරීම. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |